2022 මැයි මස 23

ගරු ස්වාමීන් වහන්ස/මහත්මයාණෙනි/මහත්මියනි, මෙනෙවියනි,

උපාධි ප්‍රදානය කිරීම - 2022

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ නියමිත පරීක්ෂණ සමත් උපාධිලාභීන් සඳහා උපාධි ප්‍රදානය සඳහා පහත සඳහන් පරිදි අදාළ මුදල දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවකට ගෙවා බැංකුව විසින් සහතික කර ආපසු දෙනු ලබන ලදුපත හා නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත 2022/06/30 දිනට පෙර ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය ,113, දුටුගැමුණු වීදිය , කොහුවල යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

උපාධි ප්‍රදානය කිරීම සඳහා ගාස්තු ගෙවීම :-

උපාධි ලබන උපාධිලාභීන් විසින් ගෙවීම් කළ යුතු ආකාරය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| උපාධිය | උපස්ථිතියෙහි (උත්සවය සඳහා සහභාගී වීම මගින්) (රු.) | අනුපස්ථිතියෙහි (උත්සවය සඳහා සහභාගී නොවීම මගින්) (රු.) |
|---|---|---|
| පශ්චාත් උපාධි | 6,000.00 | 4,500.00 |

නිවැරදිව සම්පූර්ණ කළ අයදුම් පත්‍රය සමග ඔබගේ නම සහ ලිපිනය නිවැරදිව ලියූ, රු 45/- ක මුද්දර ඇලවූ **"9x4"** ප්‍රමාණයේ ලිපි කවර දෙකක් සහ නිල් පැහැති පසුබිමෙහි පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක් එවීම අනිවාර්ය බව සැලකිය යුතුය. [පූජ්‍ය පක්ෂය සඳහා සුදුසු ඇඳුමකින්ද පිරිමි උපාධිලාභීන් උඩුකබාය (කලු) හා ටයි පටියද, ගැහැණු උපාධිලාභීන් සුදුසු ඇඳුමකට උඩුකබාය (කලු) පැළඳ ඡායාරූපය ලබාගත යුතුය]. අයදුම්පත්‍රය සමඟ ඔබ වෙත එවා ඇති අනෙක් පත්‍රිකාවෙහි අදාළ තොරතුරු සම්පූර්ණ කොට ඔබගේ ඡායාරූපය අලවා අයදුම්පත්‍රය සමඟ එවිය යුතුය. උපාධි ප්‍රදානෝත්සවය පැවැත්වෙන දිනය ලියාපදිංචි තැපැල මගින්,පුවත්පත් මගින්/කැලණිය විශ්වවිද්‍යාලයේ නිළ වෙබ් අඩවිය මගින් හා පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ නිළ වෙබ් අඩවිය මගින් ඉදිරියේදී ඔබ වෙත දැනුම් දෙනු ලැබේ.

2022/06/30 දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. අයදුම්පත් එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "උපාධි ප්‍රදානය කිරීම 2022 යනුවෙන් සඳහන් කළ යුතු ය.

සැලකිය යුතුයි : **ඔබගේ ශිෂ්‍ය අංකය සහ විද්‍යුත් ලිපිනය අයදුම්පත්‍රය තුළ සඳහන් කිරීම අනිවාර්ය බව දන්වමි.**

උපදෙස් :

01. මහජන බැංකුවේ කැලණිය ශාඛාවේ රැස්කිරීමේ අංක 055-1001-3066-7553 දරණ ගිණුමට අදාළ මුදල් ගෙවා ලදුපත මෙම අයදුම්පතට අමුණන්න.( මේ සඳහා වන ගෙවීම් දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවක් මගින් සිදු කළ හැකිය.
02. උපාධිලාභියා විසින් ඔහුගේම/ඇයගේම අත් අකුරින් අයදුම්පත සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ.
ඔහු/ඇය වෙනුවෙන් වෙනත් අයෙකුට අයදුම්පත සම්පූර්ණ කිරීමට අවසර නැත.
03. මුදල් ගෙවූ ලදුපත නොමැති අයදුම්පත් හා අවසාන දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.
04. උපාධි සහතිකය සකස් කළ පසු සංශෝධනයන්ට ඉඩ දෙනු නොලැබේ.
05. උපාධි සහතිකය ලබා ගැනීමට උපාධිලාභියාම පැමිණිය යුතුය.

මෙයට විශ්වාසී,

එල්.ඒ. සුමිත් ජයසේකර
**ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී**
**පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය**
011 2809321 /22
Email – pgipbs@gmail.com